John Keells Group

# JK පුවත්

2021/22 4 වන කාර්තුව | 2021 ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් පුවත්


Pg 02


Pg 03


Pg 07


Pg 04

# සමූහාධිපතිතුමාගේ පණිවුඩය



**ක්‍රිෂාන් බාලේන්ද්‍ර**
සභාපති

2022 ජනවාරි 01

හිතවත් සහෘදය,

අප සමූහ ව්‍යාපාරයේ විධායක කමිටුව වෙනුවෙන්, ඔබටත් ඔබගේ පවුලේ සැමටත් ප්‍රීතිමත්, නිරෝගී හා සෞභාග්‍යමත් සුභ නව වසරක් ප්‍රර්ථනා කරමි. අලුත් වූ සුභවාදී දැක්මකින් මෙන්ම, රටේ සාර්ව ආර්ථික තත්ත්වයන් හමුවේ අපට මුහුණ දීමට සිදුවිය හැකි අභියෝග පිළිබඳව පැහැදිලි අවබෝධයකින් යුතුව 2022 නව වසර ආරම්භ කරන මේ මොහොතේ, පසුගිය වසර පුරාම ඔබ සියලුම දෙනාගෙන් ලැබුණු දායකත්වය වෙනුවෙන් මුලින්ම මාගේ ස්තූතිය පළකර සිටිමි. 2021 වසරේදී අප අපේක්ෂා නොකළ ආකාරයේ ආකාරයේ බාධාවන් හා සංචරණ සීමා පැනවීම් වලට මුහුණ දීමට සිදු වුවද, එම බාධාවන් හමුවේ ඔබ කටයුතු කළ ආකාරය පිළිබඳව අපට ආඩම්බර විය හැකි ය. එය ජෝන් කීල්ස් සමූහයේ නිත්‍ය ගුණාංගයන් වන අභියෝග වලට මුහුණ දීමේ හැකියාව, උද්යෝගය හා අධිෂ්ඨානය යනාදිය යළි-යළිත් ප්‍රදර්ශනය කිරීමක් ලෙස මම දකිමි. අපගේ සමාගමේ වටිනාකම් අනුව කටයුතු කරමින් සහ, අප සමූහයේ සාමාජික සාමාජිකාවන් සහ ප්‍රජාවන් ඇතුළු සියලුම දෙනාගේ යහපත සලසමින් ව්‍යාපාරික විශිෂ්ටත්වය ළඟා කරගැනීමට අප සියලුම දෙනා කැපවුණු ආකාරය, ජෝන් කීල්ස් සමූහ ව්‍යාපාරයේ සැබෑ හරය මැනැවින් නිරූපණය කරන්නකි.

පසුගිය වසරේදී දිගින් දිගටම පෙර නොවූවිරූ තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වූ පසුබිමක් තුළ පවා සුවිශේෂී සන්ධිස්ථානයන් සනිටුහන් කිරීමට අපට හැකි වූ ආකාරය සම්බන්ධයෙන් විශේෂ උදාහරණ කිහිපයක් ඔබ හමුවේ තැබීමට මම මෙය අවස්ථාවක් කරගනිමි. Cinnamon Life ව්‍යාපෘතියේ නේවාසික හා වාණිජ කුලුනු වල ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට අපට හැකි වූ අතර, 'Offices at Cinnamon Life' හි කුලී පදනම මත ලබාදීමට වෙන්කර තිබූ සියලුම අවකාශයන් සඳහා ප්‍රධාන ගැනුම්කරුවෙකු ඉදිරිපත් වීම, අප ලැබූ කැපීපෙනෙන ජයග්‍රහණයකි. එමෙන්ම අප සමූහයේ දෙවැනි වරාය පර්යන්තය වශයෙන්, කොළඹ වරායේ බටහිර බහාලුම් පර්යන්තය ඉදිකිරීම සඳහා ඉන්දියාවේ අදානි සමූහ ව්‍යාපාරය සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමග ගිවිසුමකට එළඹීමට අපට හැකි විය. කොළඹ බටහිර ජාත්‍යන්තර පර්යන්තය, ශ්‍රී ලංකාව තුළ අප සිදුකරන විශාලතම ආයෝජනය වනු ඇත. අප සමූහය සිදු කළ තවත් සුවිශේෂී වැදගත්කමකින් යුත් ආයෝජනයක් නම්, අපගේ කොටස් හිමිකරුවන්ගේ එකඟත්වය සහිතව, ආසියානු සංවර්ධන බැංකුව තුළ ඇමරිකානු ඩොලර් මිලියන 80 ක් දක්වා පෞද්ගලික කොටස් තැන්පතුවක් සිදුකිරීමයි. මෙම අර්බුදකාරී කාලසීමාව තුළ, ශ්‍රී ලංකාව තුළ ආයෝජනය කිරීම සඳහා ලොව ඉහළම පෙළේ ආයෝජකයෙකු ආකර්ෂණය කරගැනීමට හැකි වීම, ජෝන් කීල්ස් සමූහ ව්‍යාපාරයේ ශක්තියට මනා සාක්ෂියක් බව මම අවංකවම විශ්වාස කරමි. එමෙන්ම 2021 වසරේ අප සිදුකළ තවත් ප්‍රධාන පෙළේ ගනුදෙනුවක් නම්, Cinnamon Life ව්‍යාපෘතියට අදාළ ඇමරිකානු ඩොලර් මිලියන 395 ක කාලීන ණය පහසුකම සඳහා ප්‍රතිමූල්‍යකරණ කටයුතු සම්පූර්ණ කිරීමයි. ඉහත දක්වා ඇත්තේ පසුගිය වසර තුළ අප සමූහ ව්‍යාපාරය සනිටුහන් කළ සුවිශේෂී සන්ධිස්ථාන කිහිපයක් පමණි. මීට අමතරව, අපගේ සමූහ ව්‍යාපාරයට සම්බන්ධ සියලුම සමාගම්, ඉතාමත් කාර්යක්ෂම ලෙස තම ව්‍යාපාර කටයුතු සිදුකරමින්, 2021 වර්ෂය සඳහා වූ තම වර්ධන සැලසුම් සාර්ථක ලෙස ක්‍රියාවට නැංවීමට සමත් විය. මෙම ජයග්‍රහණ දෙස ආපසු හැරී බලන විට, අප සාමූහිකව අත්කරගෙන ඇති ප්‍රගතිය සම්බන්ධයෙන් අපට සැබැවින්ම ආඩම්බර විය හැකි වේ.

2022 වසරේදීද දිගින් දිගටම පෙරළිකාරී නවෝත්පාදන සහ දත්ත පදනම් කරගත් තීරණ මෙන්ම, DE&I (Diversity, Equity and Inclusion) සහ ESG (Environmental, Social and Governance) සංකල්ප සම්බන්ධයෙන් ප්‍රමුඛ පෙළේ අවධානයක් යොමුකිරීමට අපි බලාපොරොත්තු වන්නෙමු. OCTAVE වැඩසටහනද පාරිභෝගික වෙළඳාම්, මූල්‍ය සේවා සහ පාරිභෝගික ආහාරපාන ක්ෂේත්‍ර වලට අදාළව පැහැදිලි ප්‍රගතියක් අත්පත් කරගනිමින් ඉදිරියට යමින් පවතින අතර, Single customer view සම්බන්ධයෙන් සමස්ත සමූහයම ආවරණය කරන වැඩසටහනද සාර්ථකව ලෙස ක්‍රියාත්මක වෙමින් පවතී. අපගේ ආයෝජකයන්, කොටස් හිමිකරුවන් සහ පොදු මහජනතාව මේ වනවිට ESG හෙවත් පරිසරය, සමාජය සහ ආයතනික පාලනය සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමුකර ඇති අතර, ONE JKH ව්‍යාපෘතිය හරහා අප ක්‍රියාවට නංවන වැඩසටහන් මෙන්ම, ප්‍රජා ශක්ති සහ ජෝන් කීල්ස් පදනම වැනි ව්‍යාපෘතිද, තිරසාරත්වය සම්බන්ධයෙන් අප ක්‍රියාවට නංවා ඇති වැඩසටහන්ද අපට අතිශයින් වැදගත් ය. ඒවා අපගේ ව්‍යාපාර කටයුතු වලට මෙන්ම, ජනතාව, ප්‍රජාවන් සහ පරිසරය යනාදී සියලුම අංශයන්ට යහපත් ලෙස බලපානු ඇත.

ජෝන් කීල්ස් කණ්ඩායමේ ඔබ සියලුම දෙනාගේ උනන්දුව හා කැපවීම අගය කිරීමට මා මෙය අවස්ථාවක් කරගන්නා අතර, නව වසර තුළදීත් ඔබගේ සහයෝගය එලෙසින්ම ලැබෙනු ඇතැයි බලාපොරොත්තු වෙමි. COVID-19 වසංගතය තවමත් අවසන් වී නොතිබුණද, එමෙන්ම සාර්ව ආර්ථික පරිසරය දිගින් දිගටම අපට අභියෝග එල්ල කිරීමට ඉඩ තිබුණද, අපගේ සියලුම ව්‍යාපාරයන් වෙනුවෙන් අප ගොඩනංවාගෙන ඇති ශක්තිමත් පදනම් ඔස්සේ, අප තුළ කවදත් පැවති ගුණාංග වන කණ්ඩායම් හැඟීම, උද්යෝගය හා කැපවීම සමගින්, දීර්ඝකාලීන ඉලක්ක කරා ගමන් කිරීම අපට අපහසු නොවනු ඇති බව මගේ විශ්වාසයයි. ඒ ගමන තුළදී 2022 වසර තවත් සාර්ථක වසරක් බවට පත්කර ගැනීමට ඔබගේ නොසැලෙන සහයෝගය ලැබෙනු ඇතැයි මම උදක්ම අපේක්ෂා කරමි.

ඔබ සැමට ස්තූතියි. සුරක්ෂිතව සිටින්න.

මෙයට හිතවත්,
ක්‍රිෂාන්

# සම්මාන සහ පිළිගැනීම්

**56 වන වාර්ෂික වාර්තා සම්මාන උළෙලේදී ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් පීඑල්සී සමස්ථ රන් සම්මානයෙන් පිදුම් ලබයි.**









කීල්ස්, 2021 නොවැම්බර් 30 වෙනි දින LMD විසින් ජාතියේ වඩාත් ජනප්‍රිය සුපිරිවෙළෙඳසැල සහ ජාතියේ වඩාත් ජනප්‍රිය ඔන්ලයින් සේවා සැපයුම්කරු (ආහාර සහ සිල්ලර බඩු) ලෙස පිළිගැනීමට ලක් කරන ලදි.


වික්ටෝරියා ගොල්ෆ් ඇන්ඩ් කන්ට්‍රි රිසෝට් (VGCR), 2021 ඔක්තෝම්බර් 28 වෙනි දා පැවැත් වූ 8 වෙනි වාර්ෂික ලෝක ගොල්ෆ් සම්මාන උළෙලේ දී ශ්‍රී ලංකාවේ හොදම ගොල්ෆ් පිටිය වශයෙන් පිදුම් ලබන ලදි. ලෝක ගොල්ෆ් සම්මාන උළෙල මගින් විශිෂ්ට ගොල්ෆ් සංචාරක ව්‍යාපාර, ජාත්‍යන්තර මට්ටමේ ගොල්ෆ් පිටි සහ ගොල්ෆ් ප්‍රවර්ධන ස්ථාන ඇගයීමට ලක් කරමින් මෙම ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා බිහි කරන නායකයින් පිළිගැනීමට ලක් කරයි. මෙම සම්මානය සඳහා ගොල්ෆ් ක්ෂේත්‍රය තුළ සේවය කරන වෘත්තිකයින් සහ ගොල්ෆ් සංචාරක පාරිභෝගිකයින් මනාප ප්‍රකාශ කරන ලදී.







යූනියන් ඇෂුවරන්ස් පීඑල්සී 9 වෙනි වරට සේවය කිරීම සදහා හොදම සේවා ස්ථානය ලෙස මෙන්ම 2021 වසරේ ආසියාවේ සේවය කිරීම සදහා හොදම සේවා ස්ථානය ලෙස පිළිගැනීමට ලක් විය. 2021 නොවැම්බර් 16 වෙනි දින පැවති GPTW සම්මාන උළෙලේ දී මහා පරිමාණ ව්‍යාපාර කාණ්ඩයේ ලෝකඩ සම්මානය යූනියන් ඇෂුවරන්ස් පීඑල්සී දිනා ගත්තේ මෙම කාණ්ඩයේ පළමු ස්ථාන තුන අතරට එක් වූ ශ්‍රී ලංකාවේ එකම රක්ෂණ ආයතනය බවට පත් වෙමිනි.

ජෝන් කීල්ස් IT, 2021 දෙසැම්බර් 1 වෙනි දා පැවැති SAP's brand-new King of Cluster වැඩසටහනේ දී, GAME CHANGER, ලෙස පිළිගැනීමට ලක් විය. මෙම වැඩසටහන හරහා ජෝන් කීල්ස් IT, විශිෂ්ට සන්නාම නාමයක්, සාර්ථක පාරිභෝගික අත්දැකීම් සහ විවිධ ක්ෂේත්‍රයන්හී පළපුරුද්ද ඇති හවුල්කරුවෙකු ලෙස SAP විසින් පිළිගැනීමට ලක් කරන ලදි. 2021 මයික්‍රොසොෆ්ට් ඉන්ස්පයර් හී ප්‍රධාන කාණ්ඩ 03 ක ජයග්‍රාහකයා ලෙස ජෝන් කීල්ස් IT හඳුනාගෙන ඇත. එනම් "Azure Tech Intensity Partner of the year, SAP on Azure Partner of the year, Azure Migrate Partner of the year". එපමණක් නොව, UiPath ඔටෝමේෂන් විශිෂ්ටත්ව සම්මානයේ දී කීල්ස් සදහා ඩිජිටල් ආකාරයෙන් සහාය දැක්වූ හවුල්කරු ලෙස ද ජෝන් කීල්ස් IT පිළිගැනීමට ලක් විය.



# ප්‍රධාන කාර්යාලයේ දී පළමු රාජකාරී දිනය

උදාවූ 2022 නව වසර සඳහා ජෝන් කීල්ස් සමූහ ව්‍යාපාරයේ ප්‍රධාන කාර්යාලයේ දී, සභාපති ක්‍රිෂාන් බාලේන්ද්‍ර ඇතුළු සමූහ විධායක කමිටු සාමාජිකයින් විසින් චාරිත්‍රානුකූල ලෙස පොල්තෙල් පහන් දල්වමින්, පළමු රාජකාරී දිනය සනිටුහන් කරන ලදී. සභාපතිතුමන් විසින් එදින පවත්වන ලද දේශනය සියලුම කණ්ඩායම් කාර්ය මණ්ඩලය වෙත සජීවීව විකාශය කරන ලදී.




# ආයතනික සමාජ වගකීම්

ආයතනික සමාජ වගකීම්


## ජෝන් කීල්ස් ප්‍රජා ශක්ති ඩිජිටල් අධ්‍යයන වැඩසටහන දියත් කරයි



2021 නොවැම්බර් 11 වෙනි දින ජෝන් කීල්ස් පදනම (JKF) විසින් ජෝන් කීල්ස් ප්‍රජා ශක්ති ඩිජිටල් අධ්‍යයන වැඩසටහන දියත් කරන ලදි. මෙම වැඩසටහනේ අරමුණ වනුයේ කොවිඩ්-19 වසංගත කාලය තුළ රජයේ විභාග සඳහා සූදානම් වන ආර්ථික පහසුකම් නොමැති පාසල් ළමුන්ට ඔන්ලයින් හරහා ඉගෙන ගැනීමට පහසුකම් සළසමින් අධ්‍යාපනය සඳහා පාසල් ළමුන්ට සමාන අවස්ථා ලබා දීම ය.

කොළඹ 02 සහ රනාල ප්‍රදේශයන්හි සාමාන්‍ය පෙළ සිසුන් 13 දෙනෙකුට සහ උසස් පෙළ සිසුන් 87 දෙනෙකුට සැම්සුන්ග් ටැබ් 100 ක් පිළිවෙලින් 2021 නොවැම්බර් 22 වෙනි දා සහ 11 වෙනි දා බෙදා දෙන ලදි. ඩොයිෂ් බැංකුව, ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන් සහ ඩයලොග් ආසියාටා පීඑල්සී මෙම පළමු වැඩසටහන සඳහා හවුල් වූ අතර එලිෆන්ට් හවුස් සහ සිනමන් හොටෙල්ස් ඇන්ඩ් රිසෝට්ස් රනාල සහ කොළඹ 02 යන ස්ථානවල මෙම වැඩසටහන දියත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සළසා දෙමින් සහාය දැක්විය. මෙම වැඩසටහන සඳහා අදාල ප්‍රාදේශීය ලේකම්වරුන් සහ ව්‍යාපෘති හවුල්කරුවන්ගේ නියෝජිතයින්, දෙමාපියන්, තෝරාගත් පාසල්වල විදුහල්පතිවරුන් සහ ටැබ් හිමි වූ සිසුන් සහභාගී වන ලදි.

## WAVE ව්‍යාපෘතිය (අධ්‍යාපනය හරහා ප්‍රචණ්ඩත්වය පිටුදැකීම)




ජෝන් කීල්ස් පදනම (JKF) කාන්තා හිංසනය පිටුදැකීමේ ජාත්‍යන්තර දිනය සමරමින්, WAVE ව්‍යාපෘතිය යටතේ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය (GBV) පිළිබඳව දැනුවත්භාවය වර්ධනය කිරීමේ වාර්ෂික වැඩසටහන මෙහෙයවන ලදි. කොවිඩ්-19 වසංගත කාලය තුළ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ පැමිණිලිවල වැඩිවීමක් දක්නට ලැබුණු බැවින් ප්‍රචණ්ඩත්වය පිළිබඳ නිශ්ශබ්දතාවය බිඳිමින් ඒ පිළිබඳව හඬක් නැගීම සඳහා වින්දිතයින් දිරිමත් කිරීමෙහිලා දැනුවත්භාවය ඇති කිරීම, උපදේශනය ප්‍රවර්ධනය කිරීම සහ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය එරෙහිව සටන් කිරීම සහ ඒ සම්බන්ධයෙන් වූ අභියෝග සහ විසඳුම් සාකච්ඡා කිරීමේ අරමුණ ඇතිව මෙම වසරේ වැඩසටහන ගෘහස්ථ හිංසනය පිළිබඳව අවධානය යොමු කරන ලදි.

2021 නොවැම්බර් 25 වෙනි දින සමූහාධිපතිතුමා විසින් සේවක මණ්ඩලය වෙත ලබා දුන් පණිවුඩයට අමතරව උපකාර ලබා ගත හැකි ආකාර පිළිබඳව මහජනයා තවදුරටත් දැනුවත් කිරීම සඳහා සමාජ මාධ්‍ය, රූපවාහිනී සහ කීල්ස් සුපිරි වෙළෙඳසැල් සමග උපායමාර්ගික හවුල්කාරීත්වයක් ඇති කර ගනිමින් වැඩසටහනක් දියත් කරන ලදි. ජාතික කාන්තා කමිටුවේ විධායක අධ්‍යක්ෂක මානෙල් ජයමාන්න, නියෝජ්‍ය පොලිස්පති රේණුකා ජයසුන්දර, පොලිස් පර්යේෂණ සහ සංවර්ධන කොට්ඨාශයේ අධ්‍යක්ෂිකා, නීතිඥ නිරෝෂිකා හෙට්ටිආරච්චි සහ කාන්තාවන්ට සහාය වීමේ ව්‍යාපෘති සම්බන්ධීකාරණිය, JKF මෙහෙයුම් ප්‍රධානී කාමලීන් ජයසූරිය යන මහත්මීන්ගෙන් සැදුම්ලත් විද්වත් මණ්ඩලයක් සමගින් මෙහෙය වූ සාකච්ඡාව MTV සමග උපායමාර්ගික හවුල්කාරිත්වයක් ඇති කර ගනිමින් 2021 නොවැම්බර් 24 වෙනි දා TV1 චැනලය හරහා විකාශනය කරන ලදි. මූලික සංකල්ප, රජයේ සහ නෛතික මැදිහත්වීම, බලපෑම්, ප්‍රතිවිපාක සහ GBV සඳහා ප්‍රතිකර්ම සහ GBV වැළැක්වීම සහ අවම කිරීම සඳහා බහුපාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයේ වැදගත්කම යනාදිය ඇතුළත් පුළුල් පරාසයක ගැටළු මෙම මඩුල්ල විසින් සාකච්ඡා කරන ලදි.

## නත්තල සඳහා ඔන්ලයින් කලා පොළ






2021 පෙබරවාරි මස ඔන්ලයින් පැවැත් වූ කලා පොළ සාර්ථක වූ බැවින් කොවිඩ්-19 වසංගත කාලය තුළ ද ශ්‍රී ලාංකීය කලාකරුවන් සවිබලගැන්වීම අඛණ්ඩව සිදු කිරීමේ අරමුණ ඇතිව නැවත වරක් නත්තල් උත්සවයට පෙරගාමීව, ප්‍රථම වරට ඔන්ලයින් කලා පොළක් පැවැත්වීමට JKF, ජෝර්ජ් කීට් පදනම සමග එක්ව තීරණය කරන ලදි.

2021 නත්තල් කලා පොළ 2021 නොවැම්බර් 28 සිට දෙසැම්බර් 12 දක්වා සජීවීව පවත්වන ලදි. ඡායාරූප JKF විසින් www.srilankanartgallery.com හී ප්‍රදර්ශනය කරන ලද අතර කලාවේදීන් 273 දෙනෙකුගේ නිර්මාණ 5083 ක් එහි ඇතුළත් විය.

2021 නත්තල් කලා පොළ හී බැංකු හවුල්කරු ලෙස නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සහභාගී වූ අතර FriMi සමග ඇති කර ගත් උපායමාර්ගික හවුල්කාරිත්වය හරහා QR සංකේත පදනම් කර ගත් ගෙවීම් ක්‍රමවේදයක් සළසා දෙන ලදි.

නත්තල් කලා පොළේ අතුරු ඉසව් දෙකක් ද ඇතුළත් විය. එනම් ශ්‍යාමලා කලා පාසල සමග ළමා නත්තල් වැඩමුළුව සහ විදේශ රටවල කලාව ප්‍රදර්ශනය කරන කලාවේදීන්ගේ දැනුම බෙදාගැනීම සඳහා අරුන් ඩයස් බණ්ඩාරණායක, පලා පොතුපිටිය, අනෝලි පෙරේරා සහ සංජීව සෙනෙවිරත්න යන අයගේ සහභාගිත්වයෙන් මෙහෙය වූ `Spotlight on Artists' වැඩසටහන ය.

# ජෝන් කීල්ස් සමූහයේ සමූහාධිපති සම්මාන 2021



ක්‍රිෂාන් බාලේන්ද්‍ර - සභාපති



ඉසුරු ගුණසේකර - ප්‍රධාන පුද්ගල නිලධාරී සහ තිරසාර, ව්‍යාපාර අවදානම් කළමනාකරණ සහ සමූහ ක්‍රියාකාරකම් අංශ ප්‍රධානී

විශිෂ්ට ජයග්‍රාහණයන් සඳහා වූ ජෝන් කීල්ස් සමූහයේ සමූහාධිපති සම්මාන උළෙල දෙවෙනි වරට 2021 නොවැම්බර් 26 වෙනි දා අන්තර්ජාලය හරහා පවත්වන ලදි.





දිනුක් ගුණසේකර (JMSL), වීනාද්වනි ලේකම්ගේ (සිනමන් හොටෙල්ස් ඇන්ඩ් රිසෝට්ස්), ප්‍රසන්න රූප්කුමාර් (ජෝන් කීල්ස් ප්‍රොපටීස්),හසනිකා ජයසිංහ (JMSL),ජානක මධුරංග (JMSL), රක්බෝ පෙරේරා (ඔක්ටේව්) සහ ටෙෂානි වීරසේකර (JMSL) විසින් විශේෂිත සංගීත වීඩියෝවකින් උත්සවයේ සමාරම්භය සනිටුවහන් කරන ලදී. කීල්ස් ෆුඩ් ප්‍රොඩක්ට්ස් හි සන්නාම කළමණාකරු රසල් වැලන්ටයින් සහ සමූහ සන්නිවේදන අංශයේ  විධායක ඉසුරි අබේවික්‍රම විසින් උත්සවය මෙහෙයවන ලදී.




අභියෝග නොසළකා තිරසාර භාවිතයන් සඳහා වූ කැපවීම සහ ආයතනයේ සාර්ථක ක්‍රියාකාරිත්වය අගයමින් 2021 වසරේ තිරසාර ක්‍රියාකාරිත්වය සඳහා වූ සමූහාධිපති සම්මානය ටී ස්මෝල්හෝල්ඩර් ෆැක්ටරීස් පීඑල්සී වෙත පිරිනමන ලදි.

ජයග්‍රාහී කණ්ඩායම හරිෂ් වණසිංහ - ප්‍රධාන විධායක නිලධාරී , නාලක වේරගොඩ - තත්ව ආරක්ෂණ සහකාර කළමනාකරු, සංජය දිසානායක - ටී ස්මෝල්හෝල්ඩර් ෆැක්ටරීස් පීඑල්සී හී මෙහෙයුම් අංශ ප්‍රධානී සහ තිරසාර ප්‍රවර්ධක සහ  සුදාජිත් දේවප්‍රිය - ඉංජිනේරු කළමනකරු.

දිගු කාලීන තිරසාරත්වය සඳහා සමූහයේ කැපවීම නිදර්ශනය කරන කැපී පෙනෙන ක්‍රියාකාරකම් සඳහා අවධානය යොමු කරමින් තිරසාරත්වයේ විශේෂ ව්‍යාපෘති මෙම වසරේ දී ද ඇගයීමට ලක් විය. "ආහාර නාස්තිය වලක්වමු" යන ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කරමින් සමස්ථ සැපයුම්දාම කෙරෙහි ධනාත්මක බලපෑම් ඇති කරමින් දැක්වූ සැලකිය යුතු දායකත්වය නිසා ජේකේ මාකටින් සර්විසස් මෙම කාණ්ඩයේ ජයග්‍රාහකයින් ලෙස නම් කරන ලදි.




ජයග්‍රාහී කණ්ඩායම : දිනුක් ගුණසේකර - JMSL හී ජේෂ්ඨ විධායක සන්නාමනාම සංවර්ධන සහ තිරසාරත්ව ප්‍රවර්ධක, කිෂාන් පාකීර් - සහකාර කළමනාකරු - සේවා සහතිකකරණ, මිනෝෂලා නිශ්ශංක - සහකාර සන්නාමනාම කළමනාකරු, නිර්මාල් හෙට්ටිආරච්චි - සහකාර කළමනාකරු, කාර්මික ප්‍රධානී - නැවුම් නිෂ්පාදන, සිසර නෙළුම්දෙණිය - සහකාර කළමනාකරු, කාණ්ඩ කළමනාකරු- නැවුම් නිෂ්පාදන සහ විසල් පෙරේරා - කළමනාකරු, කාණ්ඩ කළමනාකරු - නැවුම් නිෂ්පාදන.




පාරිභෝගික ආහාර අංශයේ 'SURGE' කණ්ඩායම 2021 ජෝන් කීල්ස් සමූහයේ පෙරලිකාර නවෝත්පාදන සඳහා වූ සමූහාධිපති සම්මානය දිනා ගන්නා ලදි.

ජයග්‍රාහී කණ්ඩායම : ඉරන්ද ගුණවර්ධන  - ව්‍යාපාර පද්ධති අංශ ප්‍රධානී, කසුන් ඇල්විටිගල - සහකාර කළමනාකරු - විකුණුම් මෙහෙයුම් සහ සැලසුම්කරණ (පාන), කවිෂාන් කනගරත්නම් - විධායක තොරතුරු තාක්ෂණ, පසන් වීරවර්ධන - විධායක තොරතුරු තාක්ෂණ, රාජිත ඇටිපොල - කළමනාකරු තොරතුරු තාක්ෂණ භාවිතයන්, රුවිමල් රොද්‍රිගෝ - සහකාර කළමනාකරු - විකුණුම් පරිපාලන (ශීතකළ රසකැවිලි).




බොහෝ සුපිරි වෙළඳසැල් කාන්තාවන්ට සාම්ප්‍රදායික නොවන රැකියාවන් සඳහා අවස්ථා නිර්මාණය කරමින් කාන්තා අධීක්ෂණ තනතුරු සඳහා ඉහළ කාන්තා දායකත්වයක් සමගින් කීල්ස් හී ස්ත්‍රී පුරුෂ අනුපාතය 49% බවට පත් කිරීම හේතුවෙන් විවිධත්වය, සාධාරණත්වය සහ අන්තර්කරණය සඳහා වූ පළමු ජෝන් කීල්ස් සමූහ සමූහාධිපති සම්මානය ජේකේ මාකටින් සර්විසස් හී HR කණ්ඩායම වෙත පිරිනමන ලදි.




ජයග්‍රාහී කණ්ඩායම : අරුණජිත් නන්දන - කළමනාකරු HR මෙහෙයුම්, අෂාන් රන්සිලිගේ - HR ප්‍රධානී, රීටේල් අංශය, සාරංග දෙහිපිටිය - කළමනාකරු කුසළතා අත්පත් කර ගැනීම, ශමින්ත ප්‍රනාන්දු - සහකාර කළමනාකරු සේවක සබඳතා සහ සුදර්ශනී බස්නායක - කළමනාකරු සේවක නියැලීම සහ කාර්මික සම්බන්ධතා.

JKH විවිධ කාණ්ඩයන්හී සේවකයින් අන්තර්කරණය අතින් වඩාත් ඉහළ මට්ටමක තැබීම සඳහා වසර පුරා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිවල දායකත්වය අගයමින් ONE JKH Core Initiatives කණ්ඩායම සඳහා 2021 සමූහාධිපති සම්මාන උළෙලේ දී විවිධත්වය, සාධාරණත්වය සහ අන්තර්කරණය සඳහා විශේෂ සම්මානයක් පිරිනමන ලදි.

කණ්ඩායම - අෂාන් රන්සිලිගේ - HR ප්‍රධානී - රීටේල් අංශය, ඉමානි පෙරේරා - සමූහ අධ්‍යයන සහ සංවර්ධන, ඉසුරු ගුණසේකර - ප්‍රධාන පුද්ගල නිලධාරී සහ තිරසාරත්ව ප්‍රධානී, ව්‍යාපාර අවදානම් කළමනාකරණ සහ සමූහ ක්‍රියාකාරකම්, ජූඩ් මාර්ටිනෝ - බීම අංශ ප්‍රධානී, පාරිභෝගික ආහාර අංශය, කුමුදු මුණසිංහ - ආයතනික සන්නිවේදන ප්‍රධානී සහ සමූහ නායකත්ව - විවිධත්වය, සාධාරණත්වය සහ අන්තර්කරණය, නදීජා තම්බයියා- සමූහ නීති, ලේකම් සහ CSR ප්‍රධානී, නෙලින්ද්‍ර ප්‍රනාන්දු- අංශ මූල්‍ය පාලක, පාරිභෝගික ආහාර අංශය, නිලූෂා ප්‍රනාන්දු - අලෙවිකරණ ප්‍රධානී, ජේකේ මාකටින් සර්විසස්, පැට්‍රික් පෙරෙයිරා - අධ්‍යයන සහ සංවර්ධන ප්‍රධානී -සිනමන් හොටෙල්ස් ඇන්ඩ් රිසෝට්ස්, ශනිත් පෙරේරා - මූල්‍ය පාලක, ප්‍රවාහන අංශ, සොනාලි පීරිස් - (හිටපු) තිරසාරත්ව, ව්‍යාපාර අවදානම් කළමනාකරණ සහ සමූහ ක්‍රියාකාරකම්, ටෙරන්ස් ප්‍රනාන්දු - සාමාන්‍යාධිකාරී, සිනමන් රෙඩ්, වින්ද්‍යා කුරේ - බැංකු රක්ෂණ ප්‍රධානි, යූනියන් ඇෂුවරන්ස් සහ විශාන්ත් විජේසිංහ - ජෝන් කීල්ස් X ප්‍රධානී.

මෙවර සම්මාන උළෙලේ විශේෂත්වය වූයේ ජෝන් කීල්ස් සමූහ ව්‍යාපාරයේ සියළුදෙනාගේ සාමූහික ප්‍රයත්නය සමූහය විසින් මෙම වසරේ ඇගයීමට ලක් කල අතර අභියෝගාත්මක කාලයක දී සමූහයේ සාර්ථකත්වය සඳහා වූ දායකත්වය අගයනු වස් මෙවර විශිෂ්ට ජයග්‍රාහණ සඳහා වූ සමූහාධිපති කණ්ඩායම් සම්මානය ජෝන් කීල්ස් සමූහයේ සියළුදෙනාම වෙනුවෙන් පිරිනැමීමට තීරණය කරන ලදි.




2021 ජෝන් කීල්ස් සමූහයේ රැකියා සතිය මෙවර 2021 නොවැම්බර් 15වන දින සිට 19වනදා දක්වා පැවැත්විණි.

මෙම වැඩසටහනේ අරමුණ වූයේ, සමූහයේ සියලුදෙනාම ඉතාමත් කැපවීමෙන් සහ උනන්දුවෙන් තම වෘත්තයේ ඉහලට යාම සඳහා දායකත්වය ලබා දීමයි.

මෙවර මෙම වැඩසටහන මගින් විවිධාංග රැසක් සංවිධානය කරන ලදී. ජ්‍යෙෂ්ඨ නායකයින් සමඟ ඒක පුද්ගල සාකච්ඡා, #MyMotivationatJKH තේමාව යටතේ පවත්වන ලද ඉන්ස්ටග්‍රෑම් තරගය, ආදර්ශමත් පාඨ ඇතුලත් චිත්‍රපට සහ පොත් නිර්දේශය, JKH පිළිබඳව දැනුම උරගා බැලීමේ ප්‍රශ්නාවලි, සමූහයෙන් බිහිවූ ව්‍යවසායකයින් ගේ ලැයිස්තුවක් සහ අවසන් වශයෙන් අපේම සහෘදයින් විසින් JKH හි සේවයේ යෙදීමට ඔවුන්ව උනන්දුකරවන සහ තමා මෙතෙක් ලැබූ හොඳම අවවාද, වීඩියෝ පට මගින් බෙදාගන්නා ලදී.




## oneJKH සමූහයේ විවිධත්වය, සාධාරණත්වය සහ අන්තර්කරණ ක්‍රියාකාරකම්











කාන්තා සේවකයින් දිරිමත් කිරීම සහ දැනුවත් කිරීම සදහා සමූහයේ කාන්තා කේන්ද්‍රීය ක්‍රියාකාරකම්වලින් එකක් වන WOICE හී දෙවෙනි අදියර 2021 නොවැම්බර් 04 වෙනි දා පවත්වන ලදි. බොහෝදුරට පුරුෂ ආධිපත්‍යයකින් යුත් ක්ෂේත්‍රයක් තුළ ඉහළ කළමනාකරණ තනතුරක් කරා ගමන් ගත් ආකාරය පිළිබදව ලංකා මරයින් සර්විසස් හී ප්‍රධාන විධායක නිලධාරිණී අනුෂ්කා වීරරත්න මහත්මියගේ අත්දැකීම් බෙදා ගැනීමට සහභාගීවූවන්ට හැකි විය. අභියෝගාත්මක සහ බොහෝ සෙයින් නියාමනය වූ ව්‍යාපාරය තුළ විවිධ ආකාරයේ ගැටළු පැනනැගුනත්, නොපසුබස්නා උත්සාහයෙන් මෙම අභියෝගවලට මුහුණ දීමෙන්, යමක් වඩාත් හොදින් කිරීමට තමාටම අභියෝග කිරීමෙන්, තමන්ගේ වගකීම් සහ යුතුකම් හොදින්ම ඉටු කිරීම ඇයට සාර්ථකත්වය සදහා මග පාදන ලදි. මෙම පටිගත කිරීම MS Stream හී සමූහයේ L&D චැනලයේ ඇත.







සිනමන් හික්කා ට්‍රාන්ස් පළමු වරට කාන්තා නඩත්තු කාර්මික ශිල්පිනියක් සහ පිහිනුම් තටාක සහායිකාවන් දෙදෙනෙකු සිය ශ්‍රම බලකායට බදවා ගැනීමෙන් සිනමන් හොටෙල්ස් සහ රිසෝට්හී විවිධත්වය, සාධාරණත්වය සහ අන්තර්කරණය සාක්ෂාත් කර ගැනීමේ තවත් කඩඉමක් ළගා කර ගන්නා ලදි. මෙම බදවා ගැනීමත් සමග හික්කඩුව සිනමන් හික්කා ට්‍රාන්ස් මෙම කඩඉම ළගා කර ගත් පළමු රිසෝට් හෝටලය බවට පත් වූ අතර එමගින් රිසෝට් හෝටලයේ ශ්‍රම බලකාය තුළ සාම්ප්‍රදායික නොවන තනතුරු සදහා කාන්තාවන් බදවා ගැනීමට ඔවුනට අවස්ථාව උදා කර දෙන ලදි. මෙම රැකියාවන් ආරම්භයේ සිටම සාම්ප්‍රදායිකව පුරුෂ පක්ෂය සදහා විවෘත වන ලදි. කෙසේ නමුත්, කාන්තාවන් සදහා මෙම රැකියා විවෘත කිරීම සදහා හික්කා ට්‍රාන්ස් වෙනස්කම් කිහිපයක්ම සිදු කරන ලදි. කාන්තා ශ්‍රමබලකාය තව 15% වැඩි කිරීමෙන් තවදුරටත් සමූහයේ DE&I ඉල්ලක්ක කරා යාමට Hikka Tranz අරමුණු කර ඇත.







ආබාධිත පුද්ගලයින්ගේ ජාත්‍යන්තර දිනය සැමරීම සදහා සිනමන් ට්‍රින්කො බ්ලූ සේවකයින්ගේ සහාය ඇතිව වීඩියෝවක් නිර්මාණය කරන ලදි. අපගේ කණ්ඩායම්හී විවිධත්වය අගය කරන සංස්කෘතියක් ගොඩනැගීම සදහා ජෝන් කීල්ස් සමූහය අඛණ්ඩව ක්‍රියා කරනවා යන පණිවුඩය රැගත් මෙම වීඩියෝව 2021 දෙසැම්බර් 03 වෙනි දා සමාජ මාධ්‍යවල විකාශනය කරන ලදි.




සමූහයේ ළමා සුරැකුම් සේවා සැපයුම්කරු සීබී (CEEBEE) මාලබේ තවත් මධ්‍යස්ථානයක් විවෘත කරන ලදි. වැඩි විස්තර සදහා ඔබගේ මානව සම්පත් ප්‍රධානියා අමතන්න.

සමූහයේ පුවත්

## යූනියන් ඇෂුවරන්ස්



යූනියන් ඇෂුවරන්ස් සිසුමග සන්නාමය යටතේ 2021 සැප්තැම්බර් 15 වෙනි දින දිවයිනේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන 397ක් වෙත ටැබ්ලට් සහ ඩෙස්ක්ටොප් පරිගණක බෙදා දෙන ලදි.



ශ්‍රී ලාංකේය රක්ෂණ ක්ෂේත්‍රයේ විශාලතම සහ වඩාත් ආකර්ශනීය ත්‍යාග යෝජනා ක්‍රමය වන යූනියන් ඇෂුවරන්ස් ප්‍රිමියර් ක්ලබ් 2021 නොවැම්බර් 07 වෙනි දා කොළඹ ෂැංග්‍රිලා හෝටලයේ දී ජයග්‍රහකයින් පිළිගැනීමට ලක් කරන ලදි. ජාත්‍යන්තර මට්ටමේ විකුණුම් සහ පාරිභෝගික සේවා ප්‍රදර්ශනය කළ සමාගමේ රක්ෂණ උපදේශකයන් ඇගයීමට ලක් කිරීම සඳහා මෙම උළෙල පවත්වන ලදි.

ඉහළම ජයග්‍රහකයින්ට ජීවන ශෛලීය සහ ව්‍යාපාර ප්‍රවර්ධන සම්මානයන් පිරිනමන ලදි. මෙමගින් ලැබුණු ප්‍රතිලාභ අතර සමාගම විසින් නඩත්තු කරන සුඛෝපභෝගී වාහනයක් සමග ඉන්ධන සහ මුදල් ප්‍රතිලාභ ඇතුළත් විය.

## ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන්









ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන් විසින් සංවිධානය කරනු ලබන වාර්ෂික සේවක සම්මාන උළෙල, semi - virtual උත්සවයක් ආකාරයෙන්, 2021 දෙසැම්බර් 17වන දින පැවැතිවිණි. මෙම සම්මාන ප්‍රදානෝත්සවයට, සම්මානලාභීන් සහ JKOA නායකත්ව කණ්ඩායම සහභාගී වූ අතර, MS Teams තුලින් සෙසු ප්‍රේක්ෂකයින් වෙත සජීවීව විකාශනය කරන ලදී. 2021 වර්ෂයේ හි 'වසරේ සේවකයා', 'වසරේ ශූරයා', සේවා විශිෂ්ටතා සම්මාන (සමාගමේ වසර 10 සහ 25 සේවා කාලය සම්පූර්ණ කළ සේවකයින් සඳහා) සඳහා සේවක සම්මාන ද පිරිනමන ලදී. කාන්තා සේවක මඩුල්ලෙහි සේවය අගය කිරීම පිණිස 'She Inspires' සම්මානය ද, 2021 සම්මාන උළෙලේදී පළමු වරට හඳුන්වා දෙන ලදී.


## සිනමන් එලයිදෝ මාලදිවයින







පියයුරු පිළිකා පිළිබඳව දැනුවත් කිරීමේ මාසය සනිටුහන් කරමින් රිසෝට් හෝටලය 2021 ඔක්තෝම්බර් 19 වෙනි දා පියයුරු පිළිකා පිළිබඳ පෝස්ටර් වැඩසටහනක් සහ දැනුවත් කිරීමේ සැසියක් පවත්වන ලදි. රිසෝට් හෝටලයේ වෛද්‍යවරයා විසින් මෙම සැසිය සේවක මණ්ඩලයේ සියළුම කාන්තා සාමාජිකයින් වෙනුවෙන් පවත්වන ලදි.







''2021 ලෝක පිරිසිදු කිරීමේ දිනය'' සමරනු වස් සිනමන් එලයිදෝ මාලදිවයින කණ්ඩායම 2021 ඔක්තෝම්බර් 5 සිට 11 දක්වා ඩිජිටල් පිරිසිදු කිරීමේ සතියක් සාර්ථකව පවත්වන ලදි.

## ජෝන් කීල්ස් ප්‍රොපටීස්

ක්‍රෙස්කැට් පුළුල් අළුත්වැඩියාවකින් පසු උත්සව සාප්පු සවාරි සදහා 2021 නොවැම්බර් 19 වෙනි දා නැවත විවෘත කරන ලදි. නගරය මැද හුරුපුරුදු ස්ථානයක පිහිටි අළුතෙන් ප්‍රතිසංස්කරණය කරන ලද සාප්පු සංකීර්ණය පාරිභෝගිකයන්ට නව අත්දැකීමක් ලබා දෙනු ඇත.







ලංකාවේ ප්‍රධානතම දේපල සංවර්ධන ආයතනයක් වන ජෝන් කීල්ස් ප්‍රොපර්ටීස් 'ද වික්ටෝරියා ගොල්ෆ් ඇන්ඩ් කන්ට්‍රි රිසෝට්' හී දේපළ වෙළදාම් සදහා ඉහළ ඉල්ලුමක් වාර්තා කරන ලදි. ලංකාවේ ප්‍රධානතම දේපල සංවර්ධන ආයතනයක් වන ජෝන් කීල්ස් ප්‍රොපර්ටීස්, 2021 නොවැම්බර් වනවිට සන්රයිස් රිඩ්ජ් හොලිඩේ හෝම්ස් හි 50% අධික ප්‍රමාණයක් විකුණා අවසන් අතර 2020 සැප්තැම්බර් මස දියත් කරන ලද මිල අධික ඉඩම් සියල්ල ද විකුණා අවසන් බව නිවේදනය කරන ලදී.

## ආයතනික මධ්‍යස්ථානය


ප්‍රධාන කාර්‍යයාලයේ මානව සම්පත් කණ්ඩායම රුහුණු විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කළ ක්‍රියාකාරකම් රැසක් සදහා සහභාගී වන ලදි. 2021 ඔක්තෝම්බර් 29 වෙනි දින අවසන් වසරේ සිසුන් සදහා අන්තර්ජාලය හරහා ආදර්ශ සම්මුඛ පරීක්ෂණ පැවැත් වූ අතර සහභාගීවූවන්ට අනාගතයේ දී සැබෑ සම්මුඛ පරීක්ෂණවලදී යොදා ගත හැකි ඵලදායී ප්‍රතිචාර ලබා දෙන ලදි.



'සාර්ථකත්වය සදහා විකල්ප මග' යන තේමාව යටතේ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන සහ රැකියා පොළ වන "RuEdCa '21" හා සමගාමීව 2021 නොවැම්බර් 28 වෙනි දා අන්තර්ජාලය හරහා වැඩමුළුවක් පවත්වන ලද අතර විශ්වවිද්‍යාලයේ සිසුන් 80 දෙනෙකු සහභාගීවන ලදි.



සිසුන්ට ජීව දත්ත පත්‍රය සකස් කරන ආකාරය පිළිබද දැනුම ලබා දීම සදහා 2021 නොවැම්බර් 26 වෙනි දා උපදේශන සැසියක් පවත්වන ලදි.







ජෝන් කීල්ස් සමූහයේ අධ්‍යයන සහ සංවර්ධන (L&D) කණ්ඩායම සමූහයේ අධ්‍යයන සංස්කෘතියට වැඩි වටිනාකමක් ලබා දීම සදහා නොවැම්බර් 11 වෙනි දා 'BRIDGE' නමින් පොදු අධ්‍යයන කළමනාකරණ පද්ධතියක් (LMS) හදුන්වාදෙන ලදි. මෙම අවස්ථාවට සහභාගී වූ සභාපති ක්‍රිෂාන් බාලේන්ද්‍ර විසින් සමූහය තුල අධ්‍යනයෙහි යෙදෙන්නන් අමතමින්, අන්තර්ජාලය භාවිතයත් සමඟ අධ්‍යාපන ක්‍රමවේද ඔන්ලයින් ක්‍රමය කරා දියුණු වී ඇති ආකාරය පිළිබඳව දැනුවත් කරන ලදී.

## සිනමන් හික්කා ට්‍රාන්ස්

කොවිඩ්-19 කාලය තුල Intermediate Care Centre (ICC) හි කාර්යයේ නිරත වූ Hikka Tranz සේවාදායකයින් ගේ විශිෂ්ඨ සේවාව අගය කිරීම පිණිස ඔක්තෝබර් පළමුවැනි දින උත්සවයක් පැවැත්විය.වසංගත තත්වය මද්‍යයේ සේවා සැපයීම ඉතාමත් දුෂ්කර වූ මොහොතක ජාතික සෞඛ්‍ය සේවාවන්ට සහය වීමේ අභියෝගය බාරගත් Hikka Tranz, දින හතක් ඇතුළත ආසිරි රෝහලේ වෛද්‍ය සේවය සමඟ එක්ව, හෝටල් පරිශ්‍රය කාමර 140 කින් යුත් කොවිඩ්-19 මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කරන ලදී. 450කට අධික ජීවිත ප්‍රමාණයක් බේරාගැනීමට කැපවූ දැඩි අවදානම් සහිත ස්ථාන සහ ICC කාර්යන්හි නිරත වූ ස්වේච්ඡා සේවකයින් හට "Health care Hero" සහ "Frontliner" සිහිවටන පිරිනමන ලදී.







## කීල්ස්

විනෝදාත්මක ඉගෙනුම් සංස්කෘතියක් සමග ඩිජිටල් අධ්‍යයන පරිසර පද්ධතියක් ගොඩනැගීමේ අරමුණ ඇතිව 2021 දෙසැම්බර් 01 වෙනි දා BMICH හී මිහිලක මැදුරේ දී "Genext' 21" නමින් අන්තර් කණ්ඩායම් දැනුම මිනුම තරගයක් කීල්ස් සංවිධානය කරන ලදි. මෙහි විශේෂත්වය වූයේ දැනුම මිනුම තරගයේ මූලික වටය KRA අන්තර්ජාල ප්ලැට්ෆෝමය හරහා පැවැත්වීම ය.

කණ්ඩායම් 126 යටතේ සේවකයින් 4000 ක් සහභාගී වූ අතර තරගයේ මූලික වටය සදහා කණ්ඩායම් 13 ක් සුදුසුකම් ලබන ලදි. අලෙවිසැල් හතරක් අවසන් පූර්ව වටය සදහා සුදුසුකම් ලබන ලදි. අවසනා තරගය පවත්වන ලද්දේ මොරටුව වෙළෙද සංකීර්ණය සහ පිටකෝට්ටේ වෙළෙදසැල අතර ය. තියුණු වට කිහිපයකින් පසුව මොරටුව වෙළෙද සංකීර්ණය කණ්ඩායම Genext'21 කුසලානය දිනා ගන්නා ලදි.








2021 වසරේ කීල්ස් සේවක සම්මානය පසුගිය 16 වැනිදා OZO Colombo හිදී පැවැත්විණි. කීල්ස් වසරේ සේවක සම්මාන උළෙල හුදෙක් වාර්ෂික උත්සවයක් පමණක් නොව, එය කීල්ස් කණ්ඩායමේ සාමාජිකයින්ගේ විශිෂ්ටත්වය සැමරීම සහ ඔවුන්ගේ සේවය ඇගයීමට ඇති මහගු අවස්ථාවකි.නාම යෝජිත සේවකයින් 7 දෙනෙක් අතුරින් කීල්ස් මෙහෙයුම් අංශයේ තුෂාර සිල්වා 2021 වසරේ විශිටතම සේවක සම්මානයයට පාත්‍ර විය. කීල්ස් හි සේවයෙහි නිරත දෛර්යවන්ත කාන්තාවන්ගේ දායකත්වය අගය කිරීම සඳහා 'She Inspires' සම්මානය ද 2021 සම්මාන උළෙලේදී පළමු වරට හඳුන්වා දෙන ලදී. වසර 25ක් පමණ කාලයක් සේවා ස්ථානයට ඉතා පක්ෂපාති ලෙස සේවයෙහි නිරත වූ සේවාදායකයින් සඳහා සේවා ඇගයීමේ සම්මානයක් ද පිරිනමන ලදී. මෙම අවස්ථාව තවත් ප්‍රබෝදමත් කිරීමට 2forty2 සංගීත කණ්ඩායම, ලහිරු පෙරේරා (La signore) සහ Beat Drummers ප්‍රසංගයක් ද පැවැත් වූ අතර මෙම උත්සවය YouTube හරහා සජීවීව විකාශනය කරන ලදී.






සමුහයේ පුවත්

## ඔක්ටේව්




ජෝන් කීල්ස් සමූහයේ දත්ත සහ උසස් විශ්ලේෂණ විශිෂ්ටතා මධ්‍යස්ථානය වන ඔක්ටේව්, කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක පාසල විසින් සංවිධානය කළ 2021 නොවැම්බර් 22 වෙනි දා සිට 2021 දෙසැම්බර් 10 වෙනි දා දක්වා පැවති පූර්ණ අන්තර්ජාලීය රැකියා පොළ සඳහා සහභාගී වන ලදි. උපාධිධාරීන්ට ඔක්ටේව් සඳහා වෙන් කරන ලද වෙළෙඳ කුටියට පැමිණ පවත්නා රැකියා පුරප්පාඩු පිළිබඳව තොරතුරු ලබා ගැනීමට මෙන්ම ඔක්ටේව් කණ්ඩායම සමග එක් වීම සඳහා අයදුම් කිරීමට අවස්ථා මෙමගින් උදා වන ලදි.

## ටී ස්මෝල්හෝල්ඩර් ෆැක්ටරීස්

ගාල්ලේ පවත්වන ජෝන් කීල්ස් ඉංග්‍රීසි භාෂා ශිෂ්‍යත්ව වැඩසටහනේ සමාරම්භක වැඩසටහන TSF PLC ෆැක්ටරීස්හී සුපරීක්ෂකයින් සහ ගේට් වේ ජාත්‍යන්තර පාසලේ නියෝජිතයින්ගේ සහභාගිත්වය ඇතිව 2021 දෙසැම්බර් 04 වෙනි දා තවලම අශෝකාරාම පන්සලේ දී පවත්වන ලදි.







කරාවිට තේ කර්මාන්තශාලාවේ ප්‍රධාන ලිපිකාරිණිය ප්‍රසූත නිවාඩු ලබා ගෙන සිටි දින 100 තුළ ඇයගේ කාර්යභාරය සිදු කිරීම ඇගයීම සඳහා නව පනාවැන්න තේ කර්මාන්තශාලාවේ ප්‍රධාන ලිපිකාරිණියට 2021 දෙසැම්බර් 1 වෙනි දා BRAVO සම්මානය පිරිනමන ලදි.




## ජෝන් කීල්ස් IT

ජෝන් කීල්ස් IT 2021 නොවැම්බර් 15 වෙනි දා රොක්ලන්ඩ් ඩිස්ටිලරීස්හී තොරතුරු තාක්ෂණ යටිතලපහසුකම් MS Azure cloud වෙත සංක්‍රමණය කිරීමේ ව්‍යාපෘතියක් ඉතාමත් සාර්ථකව නිම කරන ලදි. මෙම ව්‍යාපෘතියේ අරමුණ වූයේ තොරතුරු තාක්ෂණ යටිතලපහසුකම් වල SAP භාවිතයන්හී ක්‍රියාකාරිත්වය, නම්‍යශීලිත්වය සහ ස්ථාවරත්වය වර්ධනය කිරීම ය.

ජෝන් කීල්ස් IT කණ්ඩායම SAP හී කාර්යභාරය ඉතාමත් සමීපව තක්සේරු කර රොක්ලන්ඩ් ඩිස්ටිලරීස් (පෞද්.) සමාගමේ පවත්නා දත්ත මධ්‍යස්ථානය අභ්‍යන්තර ආපදා ප්‍රතිසාධන විසඳුමක් සමග සංක්‍රමණය කළ අතර ආයතනයට බොහෝමයක් ප්‍රතිලාභ අත් කර දෙමින් තොරතුරු තාක්ෂණ යටිතලපහසුකම් MS Azure cloud වෙත සාර්ථකව සංක්‍රමණය කිරීම සඳහා Azure ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි.



පරම්පරා ගණනාවක ශ්‍රී ලාංකීය පාරිභෝගිකයන් අතර විශිෂ්ට තත්ත්වයේ ලිපිද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා නම් දැරූ වෙළෙඳපොළ ප්‍රමුඛතම ආයතනය වන ඇට්ලස්, සිය වර්ධනය වන ඉල්ලුම සපුරාලීම සඳහා මෙහෙයුම් ධාරිතාව වැඩි කිරීමට අපේක්ෂා කරයි. ඇට්ලස් හී ඩිජිටල් සංක්‍රමණ හවුල්කරු ජෝන් කීල්ස් IT (JKIT), Azure වෙත පූර්ණ පද්ධති ක්ලවුඩ් සංක්‍රමණයක් සිදු කළ අතර මෙම ව්‍යාපෘතිය 2021 ඔක්තෝම්බර් 10 වෙනි දා සම්පූර්ණ කරන ලදි. Azure හී පරිමාණය කළ හැකි යටිතල පහසුකම් සමගින් ඇට්ලස් ආයතනයට සිය ඉල්ලුම් අවශ්‍යතාවයන්ට අනුව මෙහෙයුම් ධාරිතාව වර්ධනය කර ගත හැකි ය.



## එළිෆන්ට් හවුස්










පාරිභෝගික ආහාර අංශයේ සේවකයින් සියළුදෙනාගේම ගායන කුසලතා හඳුනාගැනීමට, ඔවුන්ව උනන්දු කරවීම සහ ඔවුන්ගේ විශිෂ්ට ගායනයන් සමගින් සිය සහෘදයන් සමග තරග කිරීමට අවස්ථාව ලබා දීම සඳහා "The Voce of CF" සංවිධානය කරන ලදි.

තරගයේ පළමු වටය වෘත්තීය විනිශ්චය මඩුල්ලක් විසින් විනිශ්චය කරන ලදි. හොඳම තරගකරුවන් 11 දෙනාට සවිස්තරාත්මක හඬ පුහුණුවක් ලබා ගැනීමට මෙන්ම ස්ටුඩියෝවක මෙහෙයුම් ක්‍රියාවලිය සියැසින් දැක බලා ගැනීමට අවස්ථාව උදා විය.

අවසන් මහා තරගය 2021 නොවැම්බර් 17 වෙනි දා විශිෂ්ට ආකාරයෙන් නිමා වූ අතර වඩාත් දක්ෂතම ගායකයා, පළමු අනුශූරයා සහ දෙවෙනි අනුශූරයා සඳහා වටිනා ත්‍යාග පිරිනමන ලදි. අවසන් මහා තරගය, FB සජීවි වැඩසටහනක් හරහා විකාශනය කරන ලදි.

## ජෝන් කීල්ස් X

ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් පීඑල්සී විසින් පවත්වාගෙන යන Startup Accelerator සහ විවෘත නව්‍යතා වැඩසටහන වන ජෝන් කීල්ස් X සිය නවතම ව්‍යාපෘතිය වන JKX 4.0 දෙසැම්බර් 01 වෙනි දා දියත් කරන ලදි. මෙය විශේෂයෙන් ඉලක්ක කරනුයේ මුල් අදියරේ පවත්නා තාක්ෂණ සහ ආරම්භක තාක්ෂණික ව්‍යාපාර ආකර්ෂණය කර ගැනීමට සහ සහාය වීමට මෙන්ම ව්‍යාපාර අභියෝග විසඳීම සහ පරිණත වූ ආරම්භක ව්‍යාපාර වර්ධනය සඳහා සහාය වීමය.




මෙම වැඩසටහන යටතේ මූලික අරමුදල් සැපයීම, උපදේශනය, පුහුණුව, කාර්යයාල ඉඩකඩ සහ අනෙකුත් සම්පත් පිරිනැමීම තුළින් ආරම්භක ව්‍යාපාර විසින් ආරම්භක අවධියේ මුහුණපාන විවිධ අභියෝගයන්ට සාර්ථකව මුහුණදීමේ අවස්ථාව ඔවුනට සළසා දෙයි. තෝරාගත් ආරම්භක ව්‍යාපාරවලට සමූහයේ සහ සමූහයේ නායකත්වය යටතේ එන ව්‍යාපාර ප්‍රවීණත්වය හා බැදුණු දැනුම ලබා ගැනීම සඳහා එම ව්‍යාපාර වෙත ප්‍රවේශවීමේ හැකියාව ලබා දී ඇත.

JKX සියළුම සහභාගිකයන් වෙත විවෘත නව්‍යතා පරිසර පද්ධතිය පුළුල් කරන ව්‍යාපාර ආයතන සමග උපායමාර්ගික හවුල්කාරිත්වයක් ද හඳුන්වා දී ඇත.

ආරම්භක ව්‍යාපාරයන් හට ජෝන් කීල්ස් සමූහය සමඟ සම්බන්ධ වී කටයුතු කිරීමේ අරමුණත් සමඟ මෙවර වැඩසටහන, 2021 දෙසැම්බර් 1වන දින 'Accelerate', 'Innovate' සහ 'Elevate' යන විශේෂිත මාර්ග ත්‍රිත්වය යටතේ දියත් කරන ලදී.

## වෝකර්ස් ටුවර්ස් සහ විටෝල්ස් ට්‍රැවල්ස්

වෝකර්ස් ටුවර්ස් සහ විටෝල්ස් ට්‍රැවල්ස්, එක්ස්ප්‍රස් පර්ල් ව්‍යවසනයේ අපද්‍රව්‍ය පිරිසිදු කිරීම සඳහා පර්ල් ප්‍රොටෙක්ටර්ස් විසින් ආරම්භ කරන ලද ශ්‍රී ලංකාවේ විශාලතම ස්වෙච්ඡා ව්‍යාපෘතිය වන 'නර්ඩල් ෆ්‍රී ලංකා' ව්‍යාපෘතියට ස්වෙච්ඡා හවුල්කරුවෙකු ලෙස සහභාගී විය.

ස්වෙච්ඡා බලඇණි 12 ක් විසින් මිලියන 60 ක ප්ලාස්ටික් කැබලි ප්‍රමාණයක කිලෝ ග්‍රෑම් 1122 ට අධික නර්ඩල්ස් එකතු කරන ලදි. එකතු කරන ලද නර්ඩල්ස් MEPA වෙත භාර දුන් අතර අනෙකුත් ප්ලාස්ටික් සහ වීදුරු අපද්‍රව්‍ය වෙන් කර වගකීමෙන් යුතුව Eco spindles සහ Zero Trash වැනි ප්‍රතිචක්‍රීයකරණ ආයතන වෙත භාර දෙන ලදි. ලෝක ස්වෙච්ඡා දිනය වන 2021 දෙසැම්බර් 05 වෙනි පැවති ස්වෙච්ඡා සේවා සම්මාන උළෙලේ දී මෙම වැඩසටහනේ සැලකිය යුතු දායකයෙකු ලෙස JKH හී ලේෂර් ඉන්බවුන්ඩ් ආයතනය පිළිගැනීමට ලක් කරන ලදි.













## ජෝන් කීල්ස් ලොජිස්ටික්ස්



ජෝන් කීල්ස් ලොජිස්ටික්ස් 2021 නොවැම්බර් 02 වෙනි දා රද්දොළුගම නවතම ගබඩා පහසුකම ඉදිකිරීම ආරම්භ කරන ලද අතර කලාපයේ වර්ධනය වන සැපයුම්දාම ඉල්ලුම සපුරාලීම සඳහා මෙම පහසුකම ශ්‍රී ලංකාවේ ලොජිස්ටික් කොරිඩෝවේ උපායමාර්ගිකව පිහිටා ඇත. මෙම ගබඩාව වර්ග අඩි 100,000 ක භූමි ප්‍රමාණයකින් සහ 18,000 CBM ගබඩා ධාරිතාවයකින් යුක්ත ය.

## ජෝන් කීල්ස් පීඑල්සී







2021 දෙසැම්බර් 21වන දින, ජෝන් කීල්ස් පීඑල්සී විසින් දුරාන් ද අල්විස් මහතා හට වසරේ සේවක සම්මානය සහ සුජීව දෙහිගස්පිටිය මහතා වසරේ ශූරයා සම්මානය ප්‍රදානය කර ඇගයීමට ලක් කරන ලදී.

ජෝන් කීල්ස් පීඑල්සී විසින් අජිත් නාරන්කොටුව මහතා වසර 25 ක් පුරා කැපවීමෙන් ආයතනයට සිදු කළ සේවාව 2021 ඔක්තෝම්බර් 25 වෙනි දා ඇගයීමට ලක් කරන ලදි.

ක්‍රීඩා, සමාජ හා සමිති

## Behind the Mic


2021 නොවැම්බර් 17 වෙනි දින ප.ව. 4.30 සිට MS Teams හරහා බිලු මැංගෝ පාට්නර්ස්හී ආයතනික සන්නිවේද විශේෂඥ/පුහුණුකරු අෂින්සනී වීරසිංහගේ සහභාගිත්වය ඇතිව කථන සමාජය එහි දෙවෙනි Behind the Mic සැසිය පවත්වන ලදි.


මෙම සැසිය මෙහෙයවන ලද්දේ ඉන්ෆෝමේටිහී අධ්‍යයන සහ සංවර්ධන සහකාර කළමනාකරු ක්ලයිඩ් රොද්‍රිගෝ විසිනි.





## ජේ කේ එච් Speaker's Club නත්තල් සාදය






Speaker's Club, එහි සාමාජිකයින් සහ ජෝන් කීල්ස් සමූහයේ අනෙකුත් සාමාජිකයින් සහභාගී කරවා ගෙන 2021 දෙසැම්බර් 16 වෙනි දා ප.ව. 5.00 සිට නත්තල් සාදයක් පවත්වන ලදි. එය නත්තල් සුභපැතුම්, කැරොල් වලින් පිරුණු සැදෑවක් විය.




**පහත සඳහන් ප්‍රශ්න 6ට පිළිතුරු සපයා වටිනා තෑගී දිනාගන්න!**

ඔබට කල යුත්තේ නවතම ජේ කේ පුවත් මුද්‍රණයේ සඳහන් ප්‍රශ්න 6ට පිළිතුරු, ඔබේ නම, ව්‍යාපාර අංශය සහ දුරකථන අංකය සමඟ 2022 පෙබරවාරී 17 වෙනි දිනට පෙර isuri.jkh@keells.com වෙත එවන්න

1. ජෝන් කීල්ස් ප්‍රජා ශක්ති ඩිජිටල් අධ්‍යයන වැඩසටහන යටතේ සිසුනට ටැබ් සහ දත්ත පැකේජයන් බෙදා දෙන ලද්දේ කුමන ස්ථාන දෙකේදී ද?
2. මෙම වසරේ සමූහාදිපති සම්මාන උළෙලේ දී පිරිනැමූ නවතම සම්මාණ කාණ්ඩයේ නම කුමක් ද?
3. මෙම වසරේ ජෝන් කීල්ස් රැකියා සතියේ ඉන්ස්ටග්‍රෑම් තරගයේ තේමාව කුමක් ද?
4. කීල්ස් විසින් සංවිධානය කළ අන්තර් කණ්ඩායම් දැනුම මිනුම තරගයේ නම කුමක් ද?
5. ජෝන් කීල්ස් X වැඩසටහනේ සුවිශේෂී තේමා 03 කුමක් ද?

### JK පුවත් පසුගිය ප්‍රශ්නාවලියේ ජයග්‍රාහිකාව



**දනූෂී රොඩ්රිගෝ**

මෙම පුවත්පත ජෝන් කීල්ස් සමූහය තුළ බෙදාහැරීමට පමණි. ඔබේ ප්‍රතිචාර යොමුකරන්න.

**ඉසුරි අබේවික්‍රම**
විධායක - සමූහ සන්නිවේදන අංශය
(Corporate Communications)

117 චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 2. දු.ක.: +94(0) 11 230 6191 වි.තැපැල්: jkh@keells.com වෙබ් අඩවිය: www.keells.com